IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2017/2018

(ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජනවාරි)

## BLE 303- ශ්‍රම ආර්ථික විද්‍යාව

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. "ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන අරමුණු වන්නේ කෙටිකාලීන ආර්ථික වර්ධන වේගය 4.5% පවත්වාගෙන යාමත් දිගුකාලීනව එය 6% දක්වා ඉහල නංවා ගැනීමත්ය."

i. ඉහත අරමුණු ඉටුකර ගැනීම් සඳහා ශ්‍රම සාධකයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා ශ්‍රම වෙළඳපල තුල ඇතිවිය යුතු වෙනස්කම් මොනවාද?

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය ඉහල නංවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමර්ග මොනවාද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. "රජය කෘෂිකාර්මික ආනයන තහනම් කිරීමට තීරණය කර ඇත."

i. මෙම තීරණය ශ්‍රම ඉල්ලුමට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. පූර්ණ තරඟකාරී වෙළඳපලක සිටින ආයතනයක ශ්‍රම ඉල්ලුම තීරණය වන ආකාරය සුදුසු රූපසටහනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. පහත සඳහන් ප්‍රකාශන සමඟ ඔබ එකඟවන්නේද නැද්ද යන්න දක්වා ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(අ) පූරණ තරඟකාරී ආයතනයක ශ්‍රම ඉල්ලුම් වක්‍රය අපූර්ණ තරඟකාරී ආයතනයක ශ්‍රම ඉල්ලුම් වක්‍රයට වඩා නම්‍ය වේ.

(ලකුණු 05)

(ආ) දිගුකාලීන ශ්‍රම ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වන්නේ ආදේශන ප්‍රතිවිපාකය නිසාය.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

03. i. පුද්ගලයෙකු ශ්‍රම වෙළඳපලට ශ්‍රමය සපයනවාද නැද්ද යන්න තීරණය කරන සාධක සුදුසු රූපසටහනක් යොදාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. බෙකර්ගේ විග්‍රහයට අනුව වැටුප් වෙනස්වීමක ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. පුද්ගලයෙකුගේ ශ්‍රම සැපයුම හා වැටුප අතර පවතින සම්බන්ධතාවයට බලපාන න්‍යායාත්මක කරුණු පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. "ප්‍රත්‍යක්ෂමූල සාධකවලට අනුව පෙනී යන්නේ වැටුප හා ස්ත්‍රී සැපයුම අතර අනුලෝම සම්බන්ධතාවයක් පැවතියද පුරුෂ ශ්‍රම සැපයුම හා වැටුප අතර එවැනි සම්බන්ධතාවයක් නොමැති බවයි." මෙවැනි තත්ත්වයක් ඇතිවීමට බලපා ඇති හේතු මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

04. i. තරඟකාරී වෙළඳපලක සමතුලිත වැටුප තීරණය වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ශ්‍රමයේ ඉල්ලුම් සහ සැපයුම් නම්‍යතාවයන් වැටුප තීරණය වීම සඳහා බලපාන ආකාරය සුදුසු රූප සටහන් යොදාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. "වැටුප් වෙනස්වුවද ශ්‍රම සැපයුම ක්ෂණිකව වෙනස් වන්නේ නැත." මෙවැනි තත්ත්වයකදී ශ්‍රම වෙළඳපල සමතුලිතය කරා ළඟාවන ආකාරය සුදුසු රූප සටහන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. i. පූර්ණ තරඟකාරී වෙළඳපලක කිසියම් වෘත්තියක නියලෙන සෑම ශ්‍රමිකයෙකුගේම වැටුප් එකිනෙකට සමාන වේ. මෙවැනි තත්ත්වයක් ඇතිවන්නේ කෙසේද යන්න සුදුසු රූපසටහනක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. ශ්‍රම වෙළඳපල තුල වැටුප් වෙනස්කම් ඇතිවීමට බලපාන ප්‍රධාන කරුණු මොනවාද?

(ලකුණු 05)

iii. පහත සංකල්ප අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(අ) අවම වැටුප් හා කාර්යක්ෂම වැටුප්

(ආ) මූල්‍ය වැටුප් හා මූර්ත වැටුප්

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. i. ශ්‍රම වෙළඳපල තුළ වෙනස්කම් කර සැලකීමේ විවිධ ස්වරූපයන් මොනවාද?

(ලකුණු 10)

ii. ශ්‍රම වෙළඳපල තුළ වෙනස්කම් කර සැලකීම් සිදුවන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ පවුල් සෞඛ්‍ය සේවාව සඳහා බඳවා ගනු ලබන්නේ කාන්තාවන් පමණි. මෙවැනි තත්ත්වයක් ඇතිවී ඇත්තේ මන්ද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

07. I වෘත්තීය සමිතියකට වැටුප් ඉහල නංවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 05)

ii. වෘත්තීය සමිතියක කේවල් කිරීමේ බලය තීරණය වන ආකාරය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. "වැඩවර්ජන ඇතිවීම කළමනාකාරීත්වයට මෙන්ම වෘත්තීය සමිතිවලට ද අහිතකර ලෙස බලපායි." එසේ නම් වැඩවර්ජන ඇති වන්නේ මන්ද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

08. පහත සංකල්ප අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

i. භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම හා ශ්‍රම ඉල්ලුම

(ලකුණු 05)

ii. ශ්‍රමයේ ආන්තික නිෂ්පාදනය (MP) සහ ශ්‍රමයේ ආන්තික අයභාර නිෂ්පාදනය (MRP)

(ලකුණු 05)

iii. ප්‍රමුඛ අනුගාමික ගැටළුව හා විකල්ප ගෙවීම් ක්‍රම

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

*****